මාධ්‍ය නිවේදනය

විධිමත් ඉදිකිරීම්, වෙළඳ හා සේවා අංශය

ආර්ථික සංණනය 2013/14

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

දුරකථනය : 011-2147401 ෆැක්ස් : 011- 2147412 2017 ඔක්තෝම්බර් 19

---

ශ්‍රී ලංකාවේ ප්‍රථම ආර්ථික සංගණනය 2013/14 යන වර්ෂ වල දී සිදු කරන ලද අතර එහිදී ආයතන ලැයිස්තු ගත කිරීම සහ එම ආයතන වලින් විස්තරාත්මක දත්ත එක්රැස් කිරීම වශයෙන් අදියර දෙකක් යටතේ දත්ත එක්රැස් කිරීම සිදු කරන ලදී. මෙහි පළමු අදියර 2013 ඔක්තෝම්බර් සහ නොවැම්බර් යන මාස වලදී ක්‍රියාත්මක කරන ලද අතර දිවයිනේ සියලුම කෘෂිකාර්මික නොවන ආර්ථික ක්‍රියාකාරකම්හි නිරත වන ආයතන මේ යටතේ ලැයිස්තු ගත කරන ලදී.

දෙවන අදියර ලෙස විධිමත් සහ අවිධිමත් යන අංශයන් යටතේ විස්තරාත්මක දත්ත එක් රැස් කිරීම සිදු කරන ලදී. මෙහි දී විධිමත් ආයතන වල දත්ත එක් රැස් කිරීම ප්‍රශ්නාවලීන් දෙකක් මගින්ද, අවිධිමත් ආයතන වල දත්ත එක් රැස් කිරීම එක් ප්‍රශ්නාවලියක් මඟින් ද සිදු කරන ලදී. විධිමත් කර්මාන්ත අංශයට අදාළ වාර්තාව මේ වන විට නිකුත් කොට ඇත.

විධිමත් අංශයේ ඉදිකිරීම්, වෙළඳ හා සේවා ආයතන පිළිබඳ සංගණනයට අනුව එම අංශයන්ට අදාළ මුළු ආයතන සංඛ්‍යාව 19,530 බවත්, මුළු සේවා නියුක්තිය 777,302 බවත් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්, ආචාර්ය අමර සතරසිංහ මහතා විසින් ප්‍රකාශ කරයි. මෙම අංශයන්ට අදාළව වැඩිම ආයතන සංඛ්‍යාව (11,235) සේවා අංශයෙන් වාර්තා වන අතර, එය මුළු ආයතන සංඛ්‍යාවෙන් 58% අගයක් ගනී. එමෙන්ම වැඩිම සේවා නියුත්තිය වාර්තා වන්නේ ද සේවා අංශයෙනි. එය මුළු සේවා නියුත්තියෙන් 73% අගයක් ගනු ලැබේ. ඉදිකිරීම් අංශයෙහි විධිමත් ආයතන ගණන 852 වන අතර, එය මුළු ආයතන සංඛ්‍යාවෙන් 5% අගයක් ගනු ලැබේ.

2013/14 ආර්ථික සංගණනයෙහි ඉදිකිරීම්, වෙළඳ සහ සේවා අංශයන් සලකා බලන කල පුරුෂ පාර්ශවයෙන් වැඩිම ශ්‍රම දායකත්වයක් පෙන්නුම් කරනු ලබයි. එය ඉදිකිරීම් අංශය සඳහා 91% ද, වෙළඳ අංශය සඳහා 71% ද ,සේවා අංශය සඳහා 68% ද වේ.

මේ පිළිබඳ වැඩි විස්තර දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කර ඇත.(www.statistics.gov.lk)

ආචාර්ය ඒ.ජේ.සතරසිංහ
අධ්‍යක්ෂ ජනරාල්
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව